# ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපය
# සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය
# දෙවන වාර පරීක්ෂණය 2019 මාර්තු

**13 ශ්‍රේණිය** **11 කොටස** **කාලය පැය 3**

- **ප්‍රශ්න 5 කට පමණක් පිළිතුරු සපයන්න.**

01) සන්නිවේදනය යනු අඛණ්ඩ ක්‍රියාවලිය කි. එහි දී ප්‍රතිපෝෂණය අත්‍යවශ්‍ය අංගයක් ලෙස සලකනු ලැබේ.

i) සන්නිවේදනය පිළිබඳ ඉහත අදහස් සනාථ කෙරෙන සන්නිවේදන ආකෘතිය නම් කරන්න.

ii) එම ආකෘතිය ඇඳ නම් කරන්න.

iii) වර්තමානයේ ජනසන්නිවේදනය පුද්ගල දෛනික ජීවිතයේ කොටසක් බවට පත්ව තිබේ. ජනසන්නිවේදනයේ ලක්ෂණ 3ක් නමකර විස්තර කරන්න.

iv) මූලික වශයෙන් සන්නිවේදනය යනු එක් ස්ථානයක සිට තවත් ස්ථානයකට පණිවිඩයක් ගමන් කරවීම යි. සන්නිවේදනයේ ස්වභාවය ප්‍රධාන ලක්ෂණ 4ක් ඇසුරින් විස්තර කරන්න.

02) සන්නිවේදන ක්‍රියාවලිය ග්‍රාහක කේන්ද්‍රීයව මෙන්ම සන්නිවේදක කේන්ද්‍රීයව ද විග්‍රහ කළ හැකි ක්‍රියාවලිය කි.

i) ග්‍රාහක සංඛ්‍යාව මත පදනම්ව සන්නිවේදය වර්ග කළ හැකි ආකාර 4ක් ලියන්න.

ii) ශ්‍රවණය යනු අසා සිටීමෙන් ඔබ්බට ගිය ක්‍රියාවලියක් වේ. ශ්‍රවණයේ අවස්ථා 4 කෙටියෙන් විස්තර කරන්න.

iii) ඵලදායී කථනයේ ලක්ෂණ 3ක් උදාහරණ සහිතව විස්තර කරන්න.

iv) සමූහ සන්නිවේදන නිපුණතා 4ක් නම් කර විස්තර කරන්න.

03) මුළු මහත් සමාජ පද්ධතිය ද, පුද්ගලයා ද විවිධ ගති ලක්ෂණවලින් යුක්ත වීම හේතුවෙන් ගැටුම් ඇතිවීම වැළැක්වීමට නොහැකි ය.

i) ගැල්ටුංගේ ගැටුම් ත්‍රිකෝණය ඇඳ නම් කරන්න.

ii) ගෘහස්ථ සාමය හා සහජීවනය බිඳවැටීම ගෘහය තුළ ප්‍රකටවන ආකාර 4 ක් දක්වන්න.

iii) සරල මානසික පීඩා 3ක් කෙටියෙන් විස්තර කරන්න.

iv) මාධ්‍ය ප්‍රචණ්ඩත්වය රූපවාහිනිය තුළ ප්‍රකටවන අයුරු කරුණු 4ක් ඇසුරින් විස්තර කරන්න.

04) මිනිසාගේ අදහස් ප්‍රකාශනය පහසු හා නිශ්චිත ලෙස සිදු වූයේ භාෂාව බිහිවීමෙන් පසුව යි. තාක්ෂණයේ දියුණුවත් සමග භාෂාව භාවිත කළ හැකි අවකාශ තවදුරටත් පුළුල් විය.

i) ජීව භාෂාවට අයත් ලක්ෂණ 2ක් නම් කරන්න.

ii) මාධ්‍ය සාක්ෂරතා කුසලතා 2ක් කෙටියෙන් විස්තර කරන්න.

iii) නව මාධ්‍ය හේතුවෙන් සම්මත භාෂා මුහුණදෙන අභියෝග 3ක් උදාහරණ සහිතව විස්තර කරන්න.

iv) මාධ්‍ය සාක්ෂරතාවේ අවශ්‍යතාව කරුණු 4ක් ඇසුරෙන් විස්තර කරන්න.

05) මහජන සම්බන්ධතාවයේ දී මහජනයා සුවිශේෂීවන අතර මහජන සම්බන්ධතාවය වාණිජ අවශ්‍යතාවය ද ඉක්මවා යන්න කි.

i) මහජන සම්බන්ධතාව හා දැන්වීම්කරණය අතර වෙනස කෙටියෙන් පහදන්න.

ii) වර්තමානයේ ආරක්ෂක සේවාවන්හි මාධ්‍ය ප්‍රකාශයෝ ද මහජන සම්බන්ධතාවේ යෙදී සිටිති. පොලිස් මහජන සම්බන්ධතා හා අපරාධ වැළැක්වීමේ කාර්යාංශයෙන් කෙරෙන කාර්යයන් 4ක් දක්වන්න.

iii) මහජන සම්බන්ධතා වර්ධනය කිරීම උදෙසා පවත්වනු ලබන මාධ්‍ය සාකච්ඡාවක දී අවධානය යොමු කළ යුතු කරුණු 3 ක් විස්තර කරන්න.

iv) ඔබ නව සමාගමක මහජන සම්බන්ධතා නිලධාරියා යි. නව නිෂ්පාදනයක් එළිදැක්වීම සඳහා මහජන සම්බන්ධතා සැලැස්මක් සකස් කිරීමට ඔබට පැවරී තිබේ. එහි දී ඔබ අනුගමනය කරන පියවර උදාහරණ සහිත ව විස්තර කරන්න.

06) ගෝලීය සමාජය තුළ සන්නිවේදනයේ නිම් වළලු පුළුල් වෙමින් පවති යි.

i) සංස්කෘතිය පිළිබඳ මූලිකාංග 4ක් නම් කරන්න.

ii) ස්වදේශිකත්ව සන්නිවේදන අන්තර් ඥානය ගෝලීය යුගය තුළ ද නොනැසී පවතී. කරුණු 2 ක් ඇසුරින් කෙටියෙන් විමසන්න.

iii) මාධ්‍ය සංස්කෘතිය සමාජය මත සිදු කරන බලපෑම් 3ක් උදාහරණ සහිතව විස්තර කරන්න.

iv) ගෝලීකරණයේ නව ප්‍රවණතා 4ක් විස්තර කරන්න.

07. සංවර්ධන සන්නිවේදනය යනු රටක වේගවත් වෙනසක් ඇති කිරීමට යොදා ගත හැකි කලාවක් සහ විද්‍යාවක් වේ.

i) සංවර්ධන සන්නිවේදන කාර්යයේ නිරතවන සංවර්ධන සන්නිවේදකයෙකු සතු විය යුතු මූලික කුසලතා 4ක් නම් කරන්න.

ii) සංවර්ධන සන්නිවේදන කාර්යයේ දී මා ඕ සේතුං විසින් මහජනයා හා සම්බන්ධව හඳුන්වාදුන් අංග 4කි. ඒවා නම්කර ඉන් 2ක් විස්තර කරන්න.

iii) සංවර්ධන ව්‍යාපෘතිවල දී ප්‍රජාව සහභාගි කරගැනීම අතිශය වැදගත් වේ. ප්‍රාදේශීය සංවර්ධන ක්‍රියාකාරකම්වල දී ප්‍රජාව සහභාගී කරවාගැනීමට යොදා ගත හැකි ශිල්ප ක්‍රම 3ක් විස්තර කරන්න.

iv) සංවර්ධනය පිළිබඳ දියුණු වෙමින් පවතින රටවල ජනතාව තුළ පවත්නා දේශපාලන හා සංස්කෘතික ගැටලු 4ක් විස්තර කරන්න.